සජිත් ප්‍රේමදාස, (පා.ම.)
විපක්ෂ නායක - ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
சஜித் பிரேமதாச, (பா.உ.)
எதிர்க்கட்சித் தலைவர் - இலங்கைப் பாராளுமன்றம்
Sajith Premadasa, (M.P.)
Leader of the Opposition - Parlimaent of Sri Lanka

2022.07.22

# අරගලකරුවන්ට, මාධ්‍යවේදීන්ට, සිවිල් පුරවැසියන්ට එල්ල කළ නින්දාසහගත ප්‍රහාරය පිළිකුලෙන් හෙළා දකිමු!

රාජපක්ෂලාගේ පොහොට්ටු ආණ්ඩුවට සුපුරුදු මිලේච්ඡත්වය සහ නිල ප්‍රචණ්ඩත්වය යොදා ගනිමින් වර්තමාන "රාජපක්ෂ සෙවනැලි ආණ්ඩුව" අද අළුයම් කාලයේදී ගෝල්ෆේස් හි සාමකාමී අරගලකරුවන්ට එරෙහිව බියගුළු ප්‍රචණ්ඩ ප්‍රහාරයක් එල්ල කොට තිබේ. එය වාර්තා කිරීමට පැමිණි දේශීය සහ විදේශීය මාධ්‍යවේදීන් රැසකට ද, ආබාධිත රණවිරුවන්ට ද එම අමානුෂික ප්‍රහාරයට මුහුණ දීමට සිදු වූ අතර වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම එය මිලේච්ඡ පන්නයේ නිල ප්‍රචණ්ඩත්වයකි.

නව ජනාධිපතිවරයා දිවුරුම් දී දිනයක් යන්නට මත්තෙන් මෙම අමානුෂික ප්‍රහාරය එල්ල කොට ඇති අතර ඔහු එයින් ගම්‍ය කිරීමට උත්සාහ කරනුයේ ඔහුගේ ඉදිරි පාලන තන්ත්‍රයේ ස්වභාවය නම් ඔහුට සිහිපත් කොට දිය යුත්තේ මෙවැනි මිලේච්ඡතාවයන්ට එහා ගිය බලගතු ආණ්ඩුද ජන බලයෙන් ගෙදර යවා ඇති බවය. අදාළ පුරවැසි අරගලයේ අරගලකරුවන් විසින් අත්පත් කරගෙන තිබූ සියලු ස්ථාන ආපසු ලබාදෙමින් සිටියදීත්, ඒ අතුරතුර අළුයම් කාලයේ කඩා පැන ආරක්ෂක අංශ විසින් "ඉහළ අණ අනුව" මේ බියගුලු ප්‍රහාරය එල්ල කොට ඇත. තමන්ට සිතැති රාජපක්ෂ ආණ්ඩුව ගෙදර යැවීම පිළිබඳව හටගත් වියරුවකින් අදාළ පහරදීමට අණ දුන්නා ද යන්න අප නොදන්නා නමුත් එය එසේ නොවේ යැයි සිතන්නට කිසිදු හේතුවක් නැත.

රටේ ජනතාවට අරගල කිරීමේත් විරෝධතා දැක්වීමේත් ප්‍රජාතන්ත්‍රවාදී අයිතියට අපි හැම විටම ගරු කරමු. රාජ්‍ය දේපල සහ පොදු දේපල වලට හානි නොකර,ප්‍රචණ්ඩත්වය වෙනුවට ශිෂ්ටත්වය තුළ කරන අරගල වෙනුවෙන් අපි නිරන්තරයෙන් පෙනී සිටිමු.

එක් අතකින් වර්තමාන ජනාධිපතිවරයාට බලයට පත් වන්නට මාවත සැකසෙන්නෙ ගෝල්ෆේස් ඇතුළු මේ රටේ ජනතාව සිදුකළ අරගලයේ ප්‍රතිඵලයක් ලෙසය. අදාළ අරගලය ඔහුට ජනාධිපති වීමට කිසිසේත්ම අනුබල දෙන්නක් නොවුවත් ඒ හරහා ඔහු බලය ලබා ගත්තේය. තමන් ජනාධිපති ධූරයේ දිවුරුම් දී පැය 12ක් යන්නටත් මත්තෙන් ජනාධිපතිවරයාට එය අමතක වීම කණගාටුවට කරුණක් වන අතර, ඇතැම්විට රාජපක්ෂ පාලනය පෙරළා දැමීමට අදාළ ජන අරගලය හේතු වීම පිළිබඳව ඔහු තුළ කෝපයක් ඇතිවා විය හැක.රටක් ලෙස ශිෂ්ඨ සම්පන්නව නැගී සිටීමට තිබූ සැම අවස්ථාවක්ම පසුගිය රාජපක්ෂ ආණ්ඩුව විසින් විනාශ කර දැමූ අතර වර්තමාන "රාජපක්ෂ සෙවණැලි ආණ්ඩුව" තුළින් ද සිදුවන්නට ආරම්භ වී ඇත්තේ එය ය. වෙනසකට ඇත්තේ, එය රාජපක්ෂ වියරුවටත් වඩා උග්‍ර වියරුවක් බවට පත්ව තිබීමය.

මේ රට වැටී ඇති බරපතල අගාධයේ තරම තේරුම් ගන්නවා වෙනුවට තමන්ගේ බල න්‍යාය පත්‍රය පමණක් අරමුණු කොටගෙන කටයුතු කරන මේ "රාජපක්ෂ සෙවනණැලි ආණ්ඩුව" විසින් ජනතාවට විරෝධතා දැක්වීමට ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කොට ඇති අතර, මාධ්‍යවේදීන් සතු නිදහසද අතිශයින්ම අමානුෂික ලෙස උල්ලංඝනය කොට ඇත. නිරායුධ ජනතාවට, ආබාධිත සෙබළුන්ට, සිවිල් පුරවැසියන්ට සිය අවි බලය යොදාගෙන පහර දීමට කටයුතු කළ නිල හා නොනිල සියලු දෙනාට එරෙහිව පරීක්ෂණ සිදුවිය යුතු අතර මේ මිලේච්ඡ ප්‍රහාරයට අණ දුන් සියලු දෙනා පිළිබඳව වහාම පරීක්ෂණ පැවැත්විය යුතුය.

මෙම නින්දා සහගත බියගුලු ප්‍රහාරය පිළිබඳව අප දැඩි කම්පනයට පත්වන අතර,එම ප්‍රහාරයටම උරුම පිළිකුලෙන් යුතුව අපි එය හෙළා දකිමු. අපේ රට ගෝත්‍රික තැනකට තල්ලු කිරීමට උත්සාහ කරන "රාජපක්ෂ සෙවනැලි ආණ්ඩුවට එරෙහිව"මුළු රටම නැගී සිටින දිනය වැඩි ඈතක නොවන බව අපි ආණ්ඩුවට අවධාරණය කරමු!

සජිත් ප්‍රේමදාස,
විපක්ෂ නායක.

| | | | | | |
|---|---|---|---|---|---|
| දුරකතන: Telephone: தொலைபேசி | 011 2777253<br>011 2699171 | ෆැක්ස්: Fax: தொலைநகல்: | 011 2699174 | විද්‍යුත් තැපෑල: Email: மின்னஞ்சல்: | sajith_p@dialogsl.net |

අංක 30, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 7 I இலக்கம் 30, சர் மார்கஸ் பெர்னாண்டோ மாவத்தை கொழும்பு 7 I No 30, Sir Marcus Fernando Mawatha Colombo 7